- මාර්ග නීති පිළිබඳව පූර්ණ අවබෝධයක් දරුවන්ට ලබා දෙන්නෙමු



- කුඩා අවධියේ සිටම මාර්ග නීති පිළිබඳව සරලව පැහැදිලි කරන්නෙමු



- දරුවන් මහා මාර්ගයේ හෝ පදික වේදිකාවේ එක්කරගෙන යාමේදී අතින් අල්ලාගෙන ආරක්ෂිත පැත්තෙන් යාමට කටයුතු කරන්නෙමු
- රේල් පාරේ ගමන් කිරීමට ඉඩ නොදෙමු
- යතුරු පැදියේ දරුවන් රැගෙන යන විට හෙල්මට් පැළඳවීමට කටයුතු කරන්නෙමු
- තමා රියදුරු කාර්යයේ යෙදෙන විට විනීත රියදුරෙකු ලෙස කටයුතු කිරීමට වග බලා ගන්නෙමු
- මාර්ගය දෙපැත්තේ සවි කර ඇති සංඥා පුවරු හොඳින් වටහා දෙන්නෙමු



- දරුවන් වාහනයට ඇතුල් වූ විට දොරවල් පරීක්ෂා කිරීම, ලොක් කිරීම සහ ආසන පටි පැළඳ වීම අපි සිදු කරමු
- අවිනීත අයුරින් රථ වාහන නීති කඩ කරන රියදුරන් ධාවනය කරනු ලබන වාහන වලට දරුවන් ඇතුල් කිරීමෙන් වළකිමු




- පාසල ආසන්නයේ ඇති කහ ඉර ගැන අවධානය යොමු කරමු



මාර්ග නීති වලට අවනත වෙමු !

# මාර්ගයේ ආරක්ෂිතව ගමන් කිරීම පිළිබඳව පාසැල් ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන




**මාර්ග අනතුරු වලින් පාසල් දරුවන් වළක්වාලීම, ගුරුවරුන්, දෙමව්පියන් හා වැඩිහිටියන් වන අපේ යුතුකමකි.**

**Integrated Road Investment Program (iROAD)**
**Southern Province**
**ඒකාබද්ධ මාර්ග ආයෝජන වැඩසටහන දකුණු පළාත**

**Executing Agency**
විධායක ආයතනය
Ministry of Higher Education & Highways
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය

**Funded By**
මූල්‍ය සම්පත්
Asian Development Bank (ADB)
ආසියානු සංවර්ධන බැංකුව

**Implementation Agency**
ක්‍රියාත්මක කිරීමේ ආයතනය
Road Development Authority (RDA)
මාර්ග සංවර්ධන අධිකාරිය

**Project Implementation Consultant (PIC - 01)**
ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ උපදේශක
MGC - ECL JV

Directed By : Mr. Anil Perera, TL, PIC 01 (SP)
Designed By : Mr. Somathilake Kindelpitiya, SGRS, PIC 01 (SP)

## කුඩා දරුවන් වන අපි....

- පාරේ දකුණු පසින් ගමන් කරමු.
- රාත්‍රී කාලයේ ගමන් කිරීමේදී අඳුරු ඇඳුම් ඇඳීමෙන් වළකිමු.
- මාර්ගය ආසන්නයේ සෙල්ලම් නොකරමු.
- මාර්ගයට අපද්‍රව්‍ය විසි නොකරමු.
- මාර්ගය හරහා ක්ෂණිකව මාරු නොවෙමු.
- මාර්ගයේ ධාවනය වෙමින් පවතින වාහන වලට ගොඩවීමෙන් හෝ පිටවීමෙන් වළකිමු.
- මගීන් ප්‍රවාහනය නොකරන වාහන වල (ට්‍රැක්ටර් වැනි) ගමන් නොකරමු.



- ජංගම දුරකතනය අමතමින් ගමන් කිරීමෙන් වළකිමු
- රාත්‍රී කාලයේ පා පැදි භාවිතයේදී ලයිට් පිළිබඳව සැළකිලිමත් වෙමු
- පා පැදියේ පිටුපස ඇති ටේල් ලයිට් එක තිබේදැයි පරීක්ෂාකර බලමු
- මාර්ග සංඥා පිළිබඳ දැනුම ලබා ගන්නෙමු
- මාර්ග නීති අකුරටම පිළිපදිමු
- මහා මාර්ගයේ පා පැදි වලින් එක පෙළට ගමන් නොකරමු
- දුම්රිය මාර්ගයේ ගමන් නොකරමු
- පා ගමනින් යනවිට පදික වේදිකාව පමණක් භාවිතා කරමු
- සමහර වැඩිහිටියන් මාර්ග නීති කඩ කලාට අපි එසේ නොකරමු
- ආච්චිලා, සීයාලාට නිවැරදිව පාර මාරුවීමට උදව් කරන්නෙමු
- පුංචි අපි මාර්ග නීති කඩ කරන අයට බලපෑම් කරන්නෙමු

වැඩිහිටියන්ගේ නොසැලකිල්ල දරුවන් රිය අනතුරු වලට ලක්වීමට හේතුවිය හැකිය



## ගුරුවරුන් වන අපි....

- දරුවන්ට ආදර්ශමත් වන අයුරින් මාර්ග නීති වලට අවනත වෙමින් කටයුතු කරමු
- පාසල් වාර ආරම්භ වන සෑම දිනයන්හිදීම මාර්ගයේ ආරක්ෂිතව ගමන් කරන අයුරු පාසල් ළමුන් දැනුවත් කරමු
- පාසල් වර්ෂ ආරම්භයේදී මාර්ගයේ ආරක්ෂිතව ගමන් කළ යුතු ආකාරය පිළිබඳව හා දරුවන් ඒ සඳහා යොමු කිරීම පිළිබඳව දෙමාපියන් දැනුවත් කරන්නෙමු






- දරුවන් සමග මාර්ගයේ ගමන් කරන සෑම විටම මාර්ගයේ ආරක්ෂිතව ගමන් කළ යුතු ආකාරය පිළිබඳව අවබෝධ කරවමු
- නව මාර්ගයන්හි අනතුරු ඇතිවීමේ හැකියාව බහුල බැවින් එවැනි මාර්ගයන්හි ගමන් කරන දරුවන්ට මාර්ග ආරක්ෂාව පිළිබඳව විශේෂ අවධානයක් යොමු කරමු
- පාසලට පැමිණීමේදී දුම්රිය හරස් මාර්ග වැනි අවදානම් ස්ථාන පිළිබඳව දරුවන්ගේ විශේෂ අවධානය යොමු කරවන්නෙමු
- පාසලේදී නාට්‍ය හා රංගන ආකාරයෙන්ද මාර්ග නීති ගැන තේරුම් කරන්නෙමු
- පොලිස් ස්ථානයේ රථ වාහන ඒකකයේ සහාය ඇතිව දරුවන්ට ප්‍රායෝගික දැනුමක් ලබා දෙන්නෙමු

## දෙමව්පියන් වන අපි....

- දරුවන්ට ආදර්ශයක් දෙන පරිදි මාර්ග නීති අකුරටම පිළිපදින්නෙමු

